# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2172/9 - 2020 අප්‍රේල් මස 22 වැනි බදාදා - 2020.04.22

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය

මුද්‍රාව

ගෝඨාභය රාජපක්ෂ.

### ජනාධිපති විධානය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 33 වන ව්‍යවස්ථාවෙන් අතිගරු ජනාධිපතිතුමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ආර්ථික පුනර්ජීවනය හා දරිද්‍රතාවය තුරන් කිරීම සඳහා වන කාර්ය සාධක බලකායක් ස්ථාපනය කිරීම.

1. බැසිල් රාජපක්ෂ මැතිතුමා
   ජනාධිපති විශේෂ නියෝජිත

2. ආචාර්ය නන්දලාල් වීරසිංහ මැතිතුමා
   ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධිපති, ශ්‍රී ලංකා මහ බැංකුව

3. ලුතිනන් ජනරාල් ශවේන්ද්‍ර සිල්වා මැතිතුමා
   ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී / යුධ හමුදාපති

4. ඩී.සී. වික්‍රමරත්න මැතිතුමා
   වැඩ බලන පොලිස්පති

5. මේජර් ජනරාල් (විශ්‍රාමික) ශාන්ත දිසානායක මැතිතුමා
   සභාපති, පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය

6. ජේ.ඒ. නුෂාඩ් එම්. පෙරේරා මැතිතුමා
   සභාපති, සමූපකාර තොග වෙළඳ සංස්ථාව

7. සුසන්ත රත්නායක මැතිතුමා
   සභාපති, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය

1A - G 032221 — 32 (2020/04)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

8. ජයන්ත ද සිල්වා මැතිතුමා
සභාපති, ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය

9. කිමාලි ප්‍රනාන්දු මැතිතුමිය
සභාපති, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

10. ජයම්පති මොල්ලිගොඩ මැතිතුමා
සභාපති, ශ්‍රී ලංකා තේ මණ්ඩලය

11. ප්‍රභාත් සුබසිංහ මැතිතුමා
සභාපති, අපනයන සංවර්ධන මණ්ඩලය

12. ඒ. විමලවීර මැතිතුමා
කම්කරු කොමසාරිස් ජනරාල්

13. එස්. සිංගප්පුලි මැතිතුමා
සමූපකාර සංවර්ධන කොමසාරිස්

14. රියර් අද්මිරාල් (විශ්‍රාමික) ආනන්ද පීරිස් මැතිතුමා
අධ්‍යක්ෂ ජනරාල්, සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව

15. මේජර් ජනරාල් (විශ්‍රාමික) ජී. විජිත රවිප්‍රිය මැතිතුමා
අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා රේගුව

16. බන්දුල තිලකසිරි මැතිතුමා
අධ්‍යක්ෂ ජනරාල්, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව

17. සංජය මොහොට්ටාල මැතිතුමා
අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය

18. මේජර් ජනරාල් (විශ්‍රාමික) සුදන්ත රණසිංහ මැතිතුමා
අධ්‍යක්ෂ ජනරාල්, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය

19. මහේෂ් ගම්මම්පිල මැතිතුමා
අධ්‍යක්ෂ, පොහොර ලේකම් කාර්යාලය

20. බුද්ධික මඩිහහේවා මැතිතුමා
සාමාන්‍යාධිකාරී, ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව

21. රොහාන් සෙනෙවිරත්න මැතිතුමා
අතිරේක සාමාන්‍යාධිකාරී, ලංකා විදුලිබල මණ්ඩලය

22. මනෝ සේකරම් මැතිතුමා
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික, ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය

23. මේජර් ජනරාල් (විශ්‍රාමික) සුමේධ පෙරේරා මැතිතුමා

24. සංජීව ගුණවර්ධන මැතිතුමා
විධායක නිලධාරී, ඊ.ඩබ්ලිව්. ක්‍රේසි සහ සමාගම

25. සමන්ත කුමාරසිංහ මැතිතුමා
අධිපති, නේවර්ස් සීක්‍රට් ආයතනය

26. මහේෂ් අමලියන් මැතිතුමා
සභාපති, මාස් හෝල්ඩිංග්ස්

27. ආචාර්ය රවී ලියනගේ මැතිතුමා
සභාපති, රයිගම් මාර්කටින් සර්විසස් (පුද්ගලික) සමාගම

28. පද්මලාල් විතානගේ මැතිතුමා
කළමනාකාර අධ්‍යක්ෂ, සැන්මික් සමූහ ව්‍යාපාරය

29. එස්.බී. දිවාරත්න මැතිතුමා
විශ්‍රාමික නියෝජ්‍ය භාණ්ඩාගාර ලේකම්

30. අග්‍රාමාත්‍ය ලේකම් හා මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන, මාර්ග සහ මහාමාර්ග, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන, වැවිලි කර්මාන්ත හා අපනයන කෘෂිකර්ම, කර්මාන්ත හා සැපයුම් කළමනාකරණ, විදුලිබල හා බලශක්ති, කාන්තා හා ළමා කටයුතු සහ සමාජ ආරක්ෂණ, මහවැලි, කෘෂිකර්ම, වාරිමාර්ග සහ ග්‍රාමීය සංවර්ධන, නාගරික සංවර්ධන, ජල සම්පාදන සහ නිවාස පහසුකම්, ආරක්ෂක, අභ්‍යන්තර වෙළඳ, ආහාර සුරක්ෂිතතාවය සහ පාරිභෝගික සුබසාධන, විදේශ සබඳතා යන අමාත්‍යාංශයන්හි ලේකම්වරු

වෙත,

ශුභා ශිංසන පූර්වකවය

සමස්ත ලෝකය පුරාම ව්‍යාප්ත වී ඇති කොරෝනා වසංගත තත්ත්වය (COVID 19) හමුවේ ශ්‍රී ලංකාව ඉතා සාධනීය අයුරින් එකී තත්ත්වයන් මැඩපවත්වමින් හා සාමාන්‍ය ජන ජීවිතය යථා පරිදි පවත්වා ගැනීමට බාධාවක් අවමවන සේ සියලු මහජන සේවාවන් අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා සියලුම රාජ්‍ය මෙන්ම පෞද්ගලික අංශයන් ද, රාජ්‍ය මැදිහත් වීම තුළ නිසි ක්‍රමවේදයන් යටතේ කළමනාකරණය කරමින් සිටින බව සැළකිල්ලට ගනිමින් ද,

ගෝලීය වසංගත තත්ත්වය හමුවේ සමස්ත ලෝක ප්‍රවණතාවයන් වෙනස්වී ඇති පසුබිමක, විදේශ සැපයුම් ඇණහිටීමේ තත්ත්වයන් තුළ දේශීය ආහාර නිෂ්පාදනය ඇතුළු සියලුම දේශීය කර්මාන්ත නගාසිටුවීම මෙන්ම හැකි සෑම අංශයකම අපනයනයන් ප්‍රවර්ධනය කිරීම ප්‍රමුඛව නව ආර්ථික වැඩපිළිවෙලක් ස්ථාපිත කිරීම අත්‍යවශ්‍යවන බැවින් ද,

පසුගිය කාල වකවානුව තුළ දේශීය ආර්ථික ශක්තීන්, ජාත්‍යන්තර සිද්ධාන්තයන් තුළ නිසි ඇගයීමකට ලක් නොවීම හේතුවෙන්, ග්‍රාමීය ජනතාව, වතු ප්‍රජාව හා නාගරික අඩු ආදායම්ලාභී ජනතාවගේ නිපුණතාවයන්, සුවිශේෂීතාවයන් හා ශක්‍යතාවයන් මෙන්ම, දුර්වලතා හා අභියෝගයන් තුළ නිසි තක්සේරුවට ලක් නොවීම නිසා එම ජනතා අපේක්ෂාවන් බිඳ වැටීමට ඉඩ නොදී, ජනතා අපේක්ෂාවන් ශක්තිමත් කරලමින් තාක්ෂණික, පර්යේෂණ හා නව නිපැයුම් කෙරෙහි වත්මන් රජයේ ප්‍රමුඛ අවධානය යොමුවී ඇති හෙයින් ද,

ලෝක ආර්ථික ප්‍රවණතාවයන් තුළ, ඉදිරියේ දී ශ්‍රී ලංකාව ළඟා කර ගත යුතු සමස්ත ආර්ථික සංවර්ධන ඉලක්ක හා එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් පිළිගෙන ඇති සංවර්ධන, පරිසර සංරක්ෂණය, පුනර්ජනනීය බලශක්ති, වස විසවලින් තොර ආහාර නිෂ්පාදන පුළුල් කිරීමේ අභිලාෂයන් මෙන්ම දුප්පත්කම හා ඇති නැති පරතරය වැඩිවීමේ ප්‍රවණතා අවම කරගනිමින් දිස්ත්‍රික් මට්ටමේ සමබර සමාජ හා ආර්ථික සංවර්ධනයක් ඇති කිරීමේ අවශ්‍යතාව පැහැදිලිව හඳුනාගෙන ඇති හෙයින් ද,

සුරක්ෂිතවූත්, සෞභාග්‍යමත්වූත් දේශයක් සඳහා එකී සංවර්ධන ආර්ථික ඉලක්ක සාක්ෂාත් කර ගැනීමේ දී දුප්පත්කම ප්‍රධාන පසුගාමී සාධකයක් බව ද, එහෙයින් ජනතා කේන්ද්‍රීය ආර්ථිකයක් පදනම් කරගත් ග්‍රාමීය ප්‍රජාව සවිබල ගැන්වීමේ ක්‍රමෝපායන්හි අවශ්‍යතාවය ද පෙර නොවූ විරූ ලෙස පැන නැගී ඇති බැවින් ද,

"සෞභාග්‍යයේ දැක්ම" රාජ්‍ය ප්‍රතිපත්ති රාමුව මගින් දේශය ගොඩනැංවීම සඳහා සැලසුම් කර ඇති වැඩපිළිවෙල තුළ ජාතික සංවර්ධන වැඩසටහන් මැනවින් පෙළගැස්වීමේ අවශ්‍යතාවයට ප්‍රමුඛත්වයක් දිය යුතු හෙයින් ද,

ග්‍රාමීය හා ප්‍රාදේශීය මට්ටමින් සෞඛ්‍ය පහසුකම් හා අධ්‍යාපන පහසුකම් පුළුල් කරමින්, ජනතාවගේ සෞඛ්‍යය, ගුණාත්මක ආහාර පරිභෝජනය හා පරිසර සංරක්ෂණය මෙන්ම, ශිෂ්‍යයන්ගේ නිපුණතා හා කුසලතා දියුණු කිරීමේ වැඩපිළිවෙල සඳහා වෙනම ජනාධිපති කාර්ය සාධක බලකායන් පිහිටුවා සෞඛ්‍ය, අධ්‍යාපන හා නිපුණතා අවස්ථා පුළුල් කිරීමට ප්‍රමුඛත්වය දී ඇති හෙයින් ද,

මධ්‍යම රජයේ අමාත්‍යාංශ, පළාත් සභා, දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල වශයෙන් ස්ථාපිත රාජ්‍ය යාන්ත්‍රණය ඔස්සේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර පුනර්ජීවනය කරමින් හා ග්‍රාමීය, වතු හා අඩු ආදායම්ලාභී ජනතාව ව්‍යවසායකයන් වශයෙන් දේශීය ආර්ථික බල ගැන්වීමේ ක්‍රියාදාමයට සෘජුව සම්බන්ධ කර ගැනීම සඳහා උචිත පරිදි බැංකු හා මූල්‍ය ආයතන හරහා මූල්‍යමය ප්‍රතිපාදනයන් වෙත ළඟා වීමට ඇති අවස්ථා පුළුල්කර නව ආර්ථික ප්‍රවේශයන් සහිත අනන්‍ය ආර්ථික රාමුවක් ස්ථාපිත කිරීම අත්‍යවශ්‍ය බැවින් ද,

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති ධුරන්ධර ගෝඨාභය රාජපක්ෂ වන මම, ඔබතුමන්ලාගේ විචක්ෂණභාවය, සාමාර්ථය සහ විශ්වාසවන්තභාවය කෙරෙහි මහත් වූ භක්තිය හා විශ්වාසය තබමින්, පූර්වෝක්ත ඔබතුමන්ලා, එනම්,

1. බැසිල් රාජපක්ෂ මැතිතුමා
   ජනාධිපති විශේෂ නියෝජිත

2. ආචාර්ය නන්දලාල් වීරසිංහ මැතිතුමා
   ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධිපති, ශ්‍රී ලංකා මහ බැංකුව

3. ලුතිනන් ජනරාල් ශවේන්ද්‍ර සිල්වා මැතිතුමා
   ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී / යුධ හමුදාපති

4. ඩී.සී. වික්‍රමරත්න මැතිතුමා
   වැඩ බලන පොලිස්පති

5. මේජර් ජනරාල් (විශ්‍රාමික) ශාන්ත දිසානායක මැතිතුමා
   සභාපති, පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය

6. ජේ.ඒ. නුෂාඩ් එම්. පෙරේරා මැතිතුමා
   සභාපති, සමුපකාර තොග වෙළෙඳ සංස්ථාව

7. සුසන්ත රත්නායක මැතිතුමා
   සභාපති, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය

8. ජයන්ත ද සිල්වා මැතිතුමා
   සභාපති, ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය

9. කිමාලි ප්‍රනාන්දු මැතිතුමිය
   සභාපති, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

10. ජයම්පති මොල්ලිගොඩ මැතිතුමා
    සභාපති, ශ්‍රී ලංකා තේ මණ්ඩලය

11. ප්‍රභාත් සුබසිංහ මැතිතුමා
    සභාපති, අපනයන සංවර්ධන මණ්ඩලය

12. ඒ. විමලවීර මැතිතුමා
    කම්කරු කොමසාරිස් ජනරාල්

13. එස්. සිංගප්පුලි මැතිතුමා
    සමුපකාර සංවර්ධන කොමසාරිස්

14. රියර් අද්මිරාල් (විශ්‍රාමික) ආනන්ද පීරිස් මැතිතුමා
    අධ්‍යක්ෂ ජනරාල්, සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව

15. මේජර් ජනරාල් (විශ්‍රාමික) ජී. විජිත රවිප්‍රිය මැතිතුමා
    අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා රේගුව

16. බන්දුල තිලකසිරි මැතිතුමා
    අධ්‍යක්ෂ ජනරාල්, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව

17. සංජය මොහොට්ටාල මැතිතුමා
    අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය

18. මේජර් ජනරාල් (විශ්‍රාමික) සුදන්ත රණසිංහ මැතිතුමා
    අධ්‍යක්ෂ ජනරාල්, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය

19. මහේෂ් ගම්මම්පිල මැතිතුමා
    අධ්‍යක්ෂ, පොහොර ලේකම් කාර්යාලය

20. බුද්ධික මඩිහහේවා මැතිතුමා
    සාමාන්‍යාධිකාරී, ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව

21. රොහාන් සෙනෙවිරත්න මැතිතුමා
    අතිරේක සාමාන්‍යාධිකාරී, ලංකා විදුලිබල මණ්ඩලය

22. මනෝ සේකරම් මැතිතුමා
    අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික, ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය

23. මේජර් ජනරාල් (විශ්‍රාමික) සුමේධ පෙරේරා මැතිතුමා

24. සංජීව ගුණවර්ධන මැතිතුමා
    විධායක නිලධාරී, ඊ.ඩබ්ලිව්. ක්‍රේසි සහ සමාගම

25. සමන්ත කුමාරසිංහ මැතිතුමා
    අධිපති, නේචර්ස් සීක්‍රට් ආයතනය

26. මහේෂ් අමලියන් මැතිතුමා
    සභාපති, මාස් හෝල්ඩිංග්ස්

27. ආචාර්ය රවී ලියනගේ මැතිතුමා
    සභාපති, රයිගම් මාර්කටින් සර්විසස් (පුද්ගලික) සමාගම

28. පද්මලාල් විතානගේ මැතිතුමා
    කළමනාකාර අධ්‍යක්ෂ, සැන්මික් සමූහ ව්‍යාපාරය

29. එස්.බී. දිවාරත්න මැතිතුමා
    විශ්‍රාමික නියෝජ්‍ය භාණ්ඩාගාර ලේකම්

30. අග්‍රාමාත්‍ය ලේකම් හා මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන, මාර්ග සහ මහාමාර්ග, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන, වැවිලි කර්මාන්ත හා අපනයන කෘෂිකර්ම, කර්මාන්ත හා සැපයුම් කළමනාකරණ, විදුලිබල හා බලශක්ති, කාන්තා හා ළමා කටයුතු සහ සමාජ ආරක්ෂණ, මහවැලි, කෘෂිකර්ම, වාරිමාර්ග සහ ග්‍රාමීය සංවර්ධන, නාගරික සංවර්ධන, ජල සම්පාදන සහ නිවාස පහසුකම්, ආරක්ෂක, අභ්‍යන්තර වෙළඳ, ආහාර සුරක්ෂිතතාවය සහ පාරිභෝගික සුබසාධන, විදේශ සබඳතා යන අමාත්‍යාංශයන්හි ලේකම්වරු

ආර්ථික පුනර්ජීවනය හා දරිද්‍රතාවය තුරන් කිරීම සඳහා වන කාර්ය සාධක බලකායෙහි සාමාජිකයින් ලෙස මතු දැක්වෙන කාර්යයන් ක්‍රියාත්මක කිරීම සඳහා මෙයින් පත් කරමි.

1. ලෝකය පුරා ව්‍යාප්තවී ඇති කොරෝනා වසංගත තත්ත්වය තුළ ශ්‍රී ලංකාවට ඇති ආර්ථිකමය හා සාමාජීය අභියෝගයන් හා අවස්ථාවන් කෙරෙහි සුවිශේෂී අවධානය යොමු කරමින්, සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශය තුළ අන්තර්ගත කරුණු පදනම් කරගනිමින් නව ප්‍රවේශයන් ඔස්සේ ශ්‍රී ලංකාවට අනන්‍ය වූ ආර්ථික රාමුවක් සකස් කිරීම මගින් නිෂ්පාදන ආර්ථිකයක් සඳහා අදාළ ආයතන සමග ඒකාබද්ධව පහත සඳහන් කරුණු කෙරෙහි ප්‍රමුඛ අවධානය යොමු කරමින් අවශ්‍ය මග පෙන්වීම ලබා දීම.

i. දේශීය කර්මාන්තකරුවන්, ව්‍යවසායකයින් දිරි ගන්වන සුළු ජනතා කේන්ද්‍රීය ආර්ථිකයක් ස්ථාපිත කිරීම සඳහා ඒකාබද්ධ මෙහෙයුම් ක්‍රියාත්මක කිරීම. එහි දී දේශීය ගොවි නිෂ්පාදන, කෘෂිකාර්මික නිෂ්පාදන සහ අනෙකුත් සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත නව තාක්ෂණය එක්ව කටයුතු කිරීම හා අපනයන දිරිගැන්වීමටත්, ආනයන ආදේශන නිෂ්පාදන පුළුල් කිරීම හා නිෂ්පාදන ආර්ථිකය විවිධාංගීකරණය කිරීමට අවශ්‍ය ක්‍රියා මාර්ග සකස් කිරීම මගින් වෙළෙඳ පරතරය අඩු කර ගැනීම.

ii. වී, ධාන්‍ය, එළවළු, පළතුරු, මාළු, මස්, කිරි හා බිත්තර නිෂ්පාදන ගොවිපල කටයුතු සඳහා ගොවීන්ට අවශ්‍ය පහසුකම් සැපයීම.

iii. තේ, රබර්, පොල්, කුරුඳු, ගම්මිරිස්, ආදී අපනයන වැවිලි නිෂ්පාදන, ගුණාත්මක බවින් ඉහළ තේ, පොල්තෙල්, කුළුබඩු වැනි නව තාක්ෂණික උපයෝගීත්වය තුළ අගය එකතු කිරීම් මගින් උපරිම ආර්ථික දායකත්වයකට යොමු කිරීම හා අපනයනයට යොමු කිරීම සඳහා තේ මණ්ඩලය හා අපනයන සංවර්ධන මණ්ඩලය සමග සම්බන්ධීකරණය කිරීම.

iv. ආහාර හා අනෙකුත් අත්‍යවශ්‍ය ද්‍රව්‍ය සැපයීම් ජාලය විධිමත් කිරීම පිණිස ලංකා සතොස, සතොස, සමුපකාර පද්ධතිය හා මාක්ෆෙඩ් ආයතන ජාලය පුළුල් කිරීම සඳහා නව තාක්ෂණික ක්‍රමවේදයන් හඳුන්වා දීම හා අනෙකුත් අවශ්‍ය පහසුකම් සැපයීම හා සම්බන්ධීකරණය කිරීම.

v. සාම්ප්‍රදායික කර්මාන්තයන්ට නව තාක්ෂණය එකතු කරමින් වෙළෙඳපොළට උචිත වන සේ නව්‍යකරණයට ලක්කිරීම. තවදුරටත් සාම්ප්‍රදායික රාමුවෙන් ඔබ්බට ගොස් පවතින ගෝලීය ආර්ථික තත්ත්වයන් හමුවේ නව ආදායම් උත්පාදන මූලාශ්‍රයන් ඇති කිරීම හා අපනයනය ඉලක්ක කොට ගත් කිරි, බිත්තර, පොල්, කුළුබඩු, වියළි කරවල හා කල්තබා ගත හැකි ආහාර ආශ්‍රිත අහාර නිෂ්පාදන සහ රෙදිපිළි, මුඛ ආවරණ හා සනීපාරක්ෂක නිෂ්පාදන, ගෘහ භාණ්ඩ, විසිතුරු භාණ්ඩ හා පොහොර නිෂ්පාදන ක්ෂේත්‍ර වැඩි දියුණු කිරීම සඳහා පියවර ගැනීම.

vi. නාගරික, අර්ධ නාගරික, ග්‍රාමීය හා වතු ආශ්‍රිත දුප්පත් හා අඩු ආදායම්ලාභී ජනතාව ගේ ජීවන තත්ත්වය නගා සිටුවීම සඳහා එම වර්ගීකරණය තුළ එක් එක් ජන කොටස්වලට අනන්‍ය වූ ආදායම් උත්පාදන ක්‍රමවේදයන් හඳුන්වා දීම. ඒ සඳහා අදාළ අනෙකුත් ආයතන සම්බන්ධීකරණය කරමින් අවශ්‍ය මූල්‍යමය ප්‍රතිපාදන, උපදෙස් හා අනෙකුත් පහසුකම් සැපයීම, ක්‍රියාත්මක කිරීම හා පසු විපරම් කිරීම.

vii. පරිපාලන දිස්ත්‍රික්කවල නව ආර්ථික නිෂ්පාදන සාපේක්ෂ වාසි තත්ත්වයන් තුළ හඳුනා ගැනීම හා එම දිස්ත්‍රික්කවල නිෂ්පාදන ක්ෂේත්‍රයන් බලගැන්වීම මගින් ගොවි නිෂ්පාදන, කෘෂිකාර්මික, කාර්මික හා සේවා කටයුතු පුළුල්කර ස්වයං රැකියා ඇතුළු රැකියා ප්‍රවර්ධනය හා දිළිඳු බව තුරන් කිරීම සඳහා අවශ්‍ය ක්‍රමවේදයන් සැකසීම.

viii. බිම් මට්ටමේ සේවයෙහි යෙදෙන සියලුම ක්ෂේත්‍රගත නිලධාරීන්ගෙන් විධිමත් හා ඵලදායී සේවයක් ලබා ගැනීම සඳහා සුදුසු ක්‍රමෝපායන් සකස් කොට ක්‍රියාත්මක කිරීම.

ix. නිවැරදි තොරතුරු හා දත්ත මත පදනම් වූ සේවා සැපයීමක් සහ සේවා සැපයීම් ද්විකරණය වැළැක්වීම සඳහා ICTA හා එක්ව ජාලගත කරන ලද මධ්‍යගත තොරතුරු හා දත්ත ඒකකයක් ස්ථාපිත කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම.

x. සංචාරක කර්මාන්තය සඳහා හැකිතාක් දේශීය නිෂ්පාදන සැපයීම මගින් එම කර්මාන්තයන්හි දේශීය එකතු කළ අගය වැඩි කිරීමේ වැඩ පිළිවෙළවල් සංචාරක මණ්ඩලය සමග සම්බන්ධීකරණය කිරීම.

xi. බිම් මට්ටමේ නිෂ්පාදකයින් හා ව්‍යවසායකයින් සෘජුවම ප්‍රධාන ආර්ථික ප්‍රවාහය වෙත සම්බන්ධ කිරීම සඳහා අවශ්‍ය තාක්ෂණික ක්‍රමවේදයන් හඳුන්වා දීම හා දැනුවත් කිරීම් සිදු කිරීම.

xii. කොවිඩ් - 19 වසංගත අවදානම් තත්ත්වය පහව යනතුරු ශ්‍රම බලකායෙන් බහුතරයකට නිවසේ සිට රාජකාරි කටයුතු කිරීමට සිදුවන බැවින්, එම කාණ්ඩය තුළින් උපරිම ආර්ථික ඵලදායීතාවයක් ලබා ගත හැකිවන පරිදි මෙහෙයවීම සඳහා නිකුත් කර ඇති චක්‍රලේඛන උපදෙස්වලට අනුකූල වෙමින් නිසි ක්‍රමවේදයන් සකස් කිරීම සහ එහි සාධනීය තත්ත්වයන් ඉදිරියටත් ක්‍රියාත්මක කිරීමට හැකිවන පරිදි ජනතා කේන්ද්‍රීය ඩිජිටල් පාලන ක්‍රමයක් සැකසීමට අවශ්‍ය පියවර ගැනීම.

xiii. කොවිඩ් - 19 අවදානම තුළ මතුව ඇති නව ගෝලීය ආර්ථික ප්‍රවණතා තුළින් ආර්ථිකමය වාසිදායක අවස්ථාවන් හඳුනා ගැනීම සහ ඒ තුළ අගය එකතු කළ අපනයන නිෂ්පාදන දිරිගැන්වීම සඳහා වන ක්‍රමවේදයන් සැකසීම.

xiv. රැකියා ලක්ෂයේ වැඩසටහන සඳහා හඳුනාගත් දුප්පත් පවුල් ලක්ෂයක් වෙත තිරසාර ජීවනෝපාය මාර්ග වැඩසටහන් ලබා දීම සහතික කිරීම පිණිස කඩිනම් කෘෂි නිෂ්පාදන වැඩපිළිවෙලවල් සඳහා යොමු කිරීම මගින් ඔවුන් ස්ථිරව ආදායම් ලබන පවුල් බවට පත් කිරීම මෙන්ම ජාතික නිෂ්පාදනය පුළුල් කිරීම.

xv. මූලික වශයෙන් ග්‍රාමීය, වතු හා අර්ධ නාගරික ප්‍රදේශ ආශ්‍රිතව ජීවත් වන ජනතාවට ගුණාත්මක මාර්ග පද්ධතියක් සැපයීම සඳහා වන කි.මී. ලක්ෂයක ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන මහාමාර්ග අමාත්‍යාංශය, පළාත් සභා හා ප්‍රාදේශීය සභා සමග සම්බන්ධීකරණය කරමින් ඉදිකිරීම් ක්ෂේත්‍රය මගින් රැකීරක්ෂා වැඩි කිරීම.

xvi. ග්‍රාමීය, වතු හා අර්ධ නාගරික ප්‍රදේශවල ජනතාව සෑහීමකට පත්වන අයුරින් ජල සැපයුම් 150,000 ක් ලබා දීම සහතික කරනු වස් නාගරික සංවර්ධන, ජල සම්පාදන සහ නිවාස පහසුකම් අමාත්‍යාංශය සහ ජල සම්පාදන මණ්ඩලය සමග සම්බන්ධීකරණය.

xvii. ග්‍රාමීය වැව් ප්‍රතිසංස්කරණය කරමින් වගා කටයුතු, පරිභෝජනය හා පරිසර සංරක්ෂණය වෙනුවෙන් ජල සංචිත වැඩි කිරීම මෙන්ම, පුරන් කුඹුරු අස්වැද්දීම සහ වී වගා කළ නොහැකි පුරන් කුඹුරුවල එළවළු, පලා වර්ග, සත්ත්ව ආහාර සඳහා තණබිම්, මල් වගා කටයුතු දියුණු කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම.

xviii. සුළු පරිමාණ ව්‍යාපාර සංවර්ධනය, ස්වයං රැකියා, ගෘහාශ්‍රිත කර්මාන්ත සංවර්ධන මූලාරම්භයන් ප්‍රමුඛත්වයෙහි සළකමින් දුප්පත් හා අඩු ආදායම්ලාභී ජන කොට්ඨාසයන් වෙත මූල්‍ය පහසුකම් සලසා ගැනීම පිණිස මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශය, ප්‍රාදේශීය සංවර්ධන බැංකුව, සමෘද්ධි බැංකුව, සමූපකාර බැංකු, නිවාස සංවර්ධන හා මූල්‍ය සංස්ථාව හා ක්ෂුද්‍ර මූල්‍ය ආයතන සමග සම්බන්ධීකරණය කරමින් අඩු ආදායම්ලාභීන්ට ව්‍යවසායකයින් වෙත මුදල් පහසුකම් ගලායන ක්‍රම හඳුනා ගනිමින් මූල්‍ය පහසුකම් ලබා ගැනීම පහසු කිරීම.

xix. දුප්පත් හා අඩු ආදායම්ලාභී ජනතාව අතරින් හඳුනා ගනු ලැබූ කෘෂිකාර්මික හා ව්‍යාපාර සංවර්ධනය සඳහා තිස් අවුරුදු බදු පදනම මත දීර්ඝ කාලීන බදු බලපත්‍ර ලක්ෂයක් ලබා දීම සඳහා ඉඩම් අමාත්‍යාංශය, ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව හා "බිම් සවිය" වැඩසටහන සමග සම්බන්ධීකරණය.

xx. දේශීය වෛද්‍ය පහසුකම් හා දේශීය ඖෂධ නිෂ්පාදන පුළුල් කිරීම හා බටහිර අත්‍යවශ්‍ය ඖෂධ නිෂ්පාදනය හා සෞඛ්‍ය හා සනීපාරක්ෂක ඇඳුම් හා උපකරණ නිෂ්පාදනය දිරිගැන්වීම සඳහා ආයුර්වේද කොමසාරිස් දෙපාර්තමේන්තුව හා ඖෂධ නිෂ්පාදන නීතිගත සංස්ථාව සමග සම්බන්ධීකරණය කිරීම.

xxi. රැකීරක්ෂා අවස්ථා වැඩිවන අයුරින් ධජලත් ආයෝජන ව්‍යාපෘති (Flagship Projects) නිරෝධායන වැඩ පිළිවෙලට අනුකූල වෙමින් කඩිනමින් ක්‍රියාත්මක කිරීමට ආයෝජන මණ්ඩලය හා නාගරික සංවර්ධන අධිකාරිය සම්බන්ධ කරමින් අවශ්‍ය පහසුකම් සැලසීම.

xxii. බිම් මට්ටමෙහි සේවා සැපයුම් දුප්පත් හා අඩු ආදායම්ලාභී ප්‍රජාව වෙත නිසි පරිදි ලබා ගැනීමට පහසුකම් සැලසී ඇති බව සහතික කිරීම පිණිස පළාත් පාලන ආයතන, දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල සහ අනෙකුත් රජයේ ආයතන සම්බන්ධීකරණය.

xxiii. රජයේ සහ පෞද්ගලික බීජ හා පැල තවාන් ගොවිපලවල් දිරිගැන්වීම සහ කෘෂිකාර්මික කටයුතු සඳහා අවශ්‍ය බීජ, පැලෑටි, පොහොර, උපකරණ ලබා දීමට කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, ගොවිජන සේවා දෙපාර්තමේන්තුව, සමෘද්ධි අධිකාරිය, සමූපකාර ගොවි සමිති, ගොවි සංවිධාන, පෞද්ගලික බීජ නිෂ්පාදන ආයතන මෙහෙය වීම හා අවශ්‍ය පහසුකම් සැපයීම.

xxiv. ගෙවතු වගාව, කාබනික පොහොර නිෂ්පාදනය හා භාවිතය ප්‍රචලිත කිරීම, ගෘහ වගා නිෂ්පාදන දිරිගැන්වීම, හැකිතාක් ස්වයං පරිභෝජන සැළසුමක් කෙරෙහි යොමු කිරීම සඳහා ග්‍රාමීය ව්‍යාප්ත සේවාවල නිරත වන නිලධාරීන් මෙහෙය වීම.

xxv. කොළඹ අවට ග්‍රාමීය පළාත් ද ඇතුළත්ව දිවයිනේ සියලුම සමෘද්ධිලාභී පවුල් සම්බන්ධකර ඔවුන්ගේ නිවෙස් ආශ්‍රිතව ඇති බිම් කැබලිවල පොල්, දෙල්, කොස් වැනි දිගුකාලීන වැවිලි, කෙසෙල්, ගස්ලබු, දොඩම්, දෙහි වැනි පළතුරු හා දෛනික අවශ්‍යතා සඳහා එළවළු වගා කිරීම අනිවාර්ය කිරීම හා මේ සඳහා අවශ්‍ය පැළෑටි හා වගා උපදෙස් ලබා දෙමින් එම වැඩසටහන් සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව, ගොවිජන සේවා දෙපාර්තමේන්තුව මගින් මෙහෙය වීම.

xxvi. උක්ත ක්‍රමවේදයන් ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා අදාළ වන පරිදි සියලුම රජයේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත ආයතන, විශේෂයෙන් බැංකු, පර්යේෂණ ආයතන, තොරතුරු තාක්ෂණ ආයතන, මාධ්‍ය අංශයන්හි සහාය ලබා ගැනීම.

xxvii. පෞද්ගලික අංශය විසින් සිදු කරනු ලබන ආයතනික සමාජ වගකීම් වැඩසටහන් (CSR) හැකිතාක් දුරට දිළිඳු බව තුරන් කිරීමේ ජාතික වැඩපිළිවෙලට සම්බන්ධ කර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම.

xxviii. විවිධ ජාත්‍යන්තර බැංකු හා අරමුදල් මගින් ලබා දෙන මූල්‍ය ප්‍රතිපාදන මෙම වැඩපිළිවෙල සාර්ථක කර ගැනීම සඳහා යොදා ගැනීමට අදාළ ආයතන, විදේශ සම්පත් දෙපාර්තමේන්තුව හා ආධාර දෙනු ලබන ආයතන සමග සම්බන්ධීකරණය සිදු කිරීම.

xxix. ලංකා බැංකු, මහජන බැංකු, ප්‍රාදේශීය සංවර්ධන බැංකු, සමෘද්ධි බැංකු ශාඛා මගින් ගොවීන් සඳහා අවශ්‍ය ණය මුදල් ලබා දීමට දැනට ඇති විවිධ යෝජනා ක්‍රම සරල කර සෑම බැංකු ශාඛාවකින්ම කෘෂිකර්ම හා ග්‍රාමීය සංවර්ධනය සඳහා වැඩි මූල්‍ය පහසුකම් දිසත්‍රික් මට්ටමින් ලබා දීමට අවශ්‍ය පියවර ගැනීම හා මෙහෙය වීම.

2. කොරෝනා වසංගත තත්ත්වය හමුවේ සාමාන්‍ය ජන ජීවිතය යථා පරිදි පවත්වා ගෙන යාම සඳහා සෞඛ්‍ය හා අධ්‍යාපන කාර්ය සාධක බලකායන් ගේ ක්‍රියාකාරීත්වය ද සැළකිල්ලට ගෙන, අදාළ සියලුම ආයතන සම්බන්ධීකරණය කරමින් පහත සඳහන් අංශයන් කෙරෙහි ප්‍රමුඛ අවධානය දක්වමින් නිෂ්පාදන බෙදාහැරීමට අවශ්‍ය පියවර ගැනීම.

අ. කෘෂිකාර්මික නිෂ්පාදන හා අනෙකුත් අත්‍යවශ්‍ය පාරිභෝගික ද්‍රව්‍ය පාරිභෝගිකයන්ට සෘජුව ලබා දීම සඳහා සියළු ආර්ථික මධ්‍යස්ථාන, ලංකා සතොස, සමුපකාර වෙළඳ ජාලය, කාගිල්ස්, කීල්ස්, ආර්පිකෝ, ලාෆ් හා ප්‍රාදේශීය වෙළඳ ජාලයන් සංවිධානය කිරීම හා මෙහෙයවීම

ආ. ආර්ථික මධ්‍යස්ථාන හැකිතාක් බෙදා හැරීමේ මධ්‍යස්ථාන ලෙස විමධ්‍යගත කර එම ලැබෙන ගොවි නිෂ්පාදන එම ප්‍රදේශවල පාරිභෝගිකයින්ට මෙන්ම නාගරික ප්‍රදේශවල පාරිභෝගිකයින්ට ගෘහ මට්ටමෙන් ලබා දීම සඳහා බෙදා හැරීමේ වැඩපිළිවෙල ශක්තිමත් කර ක්‍රියාත්මක කිරීම

ඇ. අත්‍යවශ්‍ය වියළි ආහාර, ඖෂධ ආනයනය මෙන්ම අපනයනය කරනු ලබන තේ, සනීපාරක්ෂක ඇඳුම් වැනි අපනයනයන් පහසු කිරීම සඳහා ශ්‍රී ලංකා වරාය,ශ්‍රී ලංකා රේගුව, ආයතනික බැංකු කටයුතු සහ අනෙකුත් රාජ්‍ය නියාමන ආයතන සම්බන්ධීකරණය හා අවශ්‍ය තීරණ ක්‍රියාත්මක කිරීම

ඈ. සහල්, පොල්, තේ, සත්ත්ව ආහාර, දේශීයව නිපදවන සනීපාරක්ෂක භාණ්ඩ හා ආහාර ප්‍රවාහනය සඳහා අවශ්‍ය ඉන්ධන, ආරක්ෂක සේවා, බැංකු පහසුකම් ලබා දීම

ඉ. අත්‍යවශ්‍ය සේවා, භාණ්ඩ හා සේවා පාරිභෝගිකයින්ට ලබා දෙන ලොරි, ත්‍රී වීලර්, පාසල් වෑන් රථ, බස් රථ, මෝටර් සයිකල්වල යෙදෙන රියදුරන්, කුලී රථ රියදුරන් හා දෛනික සේවා සපයන සහායකයින් ගේ සෞඛ්‍ය හා සනීපාරක්ෂක කටයුතු සඳහා පහසුකම් සැලසීම හා අවශ්‍ය ඉන්ධන ලබා ගැනීමට පොලිස් ඇඳිරි නීතිය පැවැත්වෙන කාලය තුළ ලංකා ඛනිජ තෙල් සංස්ථාවේ තෝරාගත් ඉන්ධන පිරවුම්හල් විවෘතව තැබීම හා අවශ්‍ය ඉන්ධන ලබා දීම

ඊ. පළාත් ආණ්ඩුකාරවරුන් ගේ සම්බන්ධීකරණයෙන් ග්‍රාමීය හා නාගරික ප්‍රදේශවල කසල බැහැර කිරීම, මාර්ග හා පොදු ස්ථාන පවිත්‍රව තබා ගැනීම, සතිපොළවල්, වෙළඳ මධ්‍යස්ථාන සනීපාරක්ෂකව පවත්වා ගැනීම සඳහා මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් ගේ හා අදාළ සේවකයින් ගේ දායකත්වය ලබා ගනිමින් සුදුසු වැඩපිළිවෙලවල් ක්‍රියාත්මක කිරීම

උ. උක්ත පහසුකම් සැපයීමේ දී, කාන්තාවන්, අඩු ආදායම්ලාභී පවුල්, ආබාධිත පුද්ගලයින්, වකුගඩු රෝගීන් හා සෘජුවම අවදානමට ලක්වූ පුද්ගලයින් සඳහා විශේෂ අවධානය යොමු කිරීමට අවශ්‍ය පියවර ගැනීම

ද්ධ. සෑම බැංකු ශාඛාවක්ම ගනුදෙනුකරුවන් ගේ අවශ්‍යතා ඉටු කිරීමට හැකිවන අත්‍යවශ්‍ය බැංකු සේවාවන් ඉටු කිරීමට හා ජංගම සේවාවන් මෙන්ම තැපැල් දෙපාර්තමේන්තු සේවා ලබා ගනිමින් ජනතාවගේ සේවා පුළුල් කිරීමට අවශ්‍ය උපදෙස් නිකුත් කිරීම හා අධීක්ෂණය කිරීම

**තව ද, ජනාධිපති විශේෂ නියෝජිත බැසිල් රාජපක්ෂ මැතිතුමා කාර්යසාධක බලකායේ සභාපති ලෙසත්,**

**අග්‍රාමාත්‍ය කාර්යාලයේ අතිරේක ලේකම් ඇන්ටන් පෙරේරා මැතිතුමා සහ ඩී.එස්. ජයවීර මැතිතුමා උක්ත කාර්යසාධක බලකායේ සම ලේකම්වරුන් ලෙසත්, පත් කරමි.**

තව ද, මෙයින් පවරනු ලබන කර්තව්‍යයන් ඉටුකරලීමට අදාළව අවශ්‍ය විය හැකි පරිදි කරුණු සොයා බැලීමට සහ උපදෙස් නිකුත් කිරීමට ආර්ථික පුනර්ජීවනය හා දරිද්‍රතාවය තුරන් කිරීම සඳහා වන කාර්ය සාධක බලකාය වෙත මම මෙයින් බලය පවරමි.

තව ද, ආර්ථික පුනර්ජීවනය හා දරිද්‍රතාවය තුරන් කිරීම සඳහා වන කාර්ය සාධක බලකායේ සාමාජිකයින් වන ඔබට කලින් කලට මා හට වාර්තා ඉදිරිපත් කිරීමට මෙයින් බලය පවරමි.

තව ද, ආර්ථික පුනර්ජීවනය හා දරිද්‍රතාවය තුරන් කිරීම සඳහා වන කාර්ය සාධක බලකාය විසින් උපදෙස් නිකුත් කරනු ලැබිය හැකි නැතහොත් සේවා සැපයීම පිණිස සහාය ඉල්ලා සිටිය හැකි සියලුම රජයේ නිලධරයන් හා එබඳු සෙසු තැනැත්තන් විසින් තත් කාර්යය සම්බන්ධයෙන් නිසි අයුරින් පිළිපැදිය හැකි එබඳු උපදෙස්වලට අනුකූලව ක්‍රියාකළ යුතු යැයි ද, ලබාදිය හැකි සියලුම සහාය සැලසිය යුතු යැයිද, සැපයිය හැකි සියලුම තොරතුරු ලබාදිය යුතු යැයි ද මම මෙයින් සියලුම රජයේ නිලධරයන්ට සහ සෙසු තැනැත්තන්ට නියම කොට විධානය කරමි.

තව ද, කිසියම් රාජ්‍ය සේවකයෙකු හෝ කිසියම් අමාත්‍යාංශයක, රජයේ දෙපාර්තමේන්තුවක, රාජ්‍ය සංස්ථාවක හෝ වෙනත් එබඳු ආයතනයක නිලධාරියෙකු විසින් පෙරකී කාර්යසාධක බලකාය විසින් පවරන ලද රාජකාරි හා වගකීම් ඉටු කිරීම ප්‍රමාද කරන හෝ පැහැර හරින සියලු අවස්ථා මා හට වාර්තා කරන ලෙස පෙරකී කාර්යසාධක බලකායට මම මෙයින් නියම කොට විධාන කරමි.

තව ද, 2020 ජනවාරි මස 24 හා 2020 මාර්තු මස 24 දිනැති දරිද්‍රතාවය තුරන් කිරීම සහ ජීවනෝපාය සංවර්ධනය සඳහා වූ කාර්ය සාධක බලකාය සහ 2020 මාර්තු මස 23 දිනැති කොරෝනා වෛරසය ශ්‍රී ලංකාවෙන් තුරන් කිරීමේ දී වැඩි අවදානම් තත්ත්වයක් ඇති කොළඹ, කළුතර, ගම්පහ, පුත්තලම, යාපනය, මන්නාරම, කිලිනොච්චිය, වවුනියාව හා මුලතිව් දිස්ත්‍රික්කවලට ප්‍රමුඛත්වය දෙමින් එම ප්‍රදේශවලට ග්‍රාමීය ප්‍රදේශ හා නිෂ්පාදකයින් විසින් සපයනු ලබන ආහාර සැපයුම් සෘජුවම පාරිභෝගිකයින්ට ලබා දීම ඇතුළු සමස්ත ජන ජීවිතය යථා පරිදි පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය වන්නා වූ සේවාවන් අඛණ්ඩව සැපයීම මෙහෙයවීම, සම්බන්ධීකරණය හා පසු විපරම පිණිස වූ ජනාධිපති කාර්ය සාධක බලකාය ස්ථාපිත කිරීම සම්බන්ධයෙන් වූ ජනාධිපති විධානයන් මෙයින් අවලංගු කරමි.

වර්ෂ දෙදහස් විස්සක් වූ අප්‍රේල් මස 21 වන දින වූ මෙදින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුද්‍රාව යටතේ කොළඹ දී දෙන ලදි.

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

**පී.බී. ජයසුන්දර,**
ජනාධිපති ලේකම්.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.